දිවි තොර කරගැනීම් සමාජ සෞඛ්‍ය ගැටළුවක් ලෙසින් සලකා වාර්තා කළ යුතු වුවත්, එහිදී ප්‍රවේශම් සහගත හා මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල ප්‍රවේශයක් භාවිතා කරන මෙන් නිරන්තරයෙන් මාධ්‍ය දැනුවත් කරන්නේ, දිවි තොර කරගැනීම් සම්බන්ධ පුවත් වාර්තාවන්ද අනුකාරක දිවි තොර කරගැනීම් සඳහා උත්ප්‍රේරකයක් වීම වැළැක්වීම සඳහායි.

"නිශ්ශංකගේ දරු සෙනේ තිස්ස වැව් පතුලේ සැඟවුණේ" යන සිරස්තලයෙන් යුතුව, සති අග අරුණ පුවත්පතේ (ජනවාරි 23, 2022) 04 වන පිටුවේ සම්පූර්ණ පිටුවක් පුරා පළ වී තිබූ ලිපිය මෙහිදී උදාහරණ ලෙසින් ගත හැක.

මෙහි,
දිවි තොර කරගැනීමක් පිළිබඳ පුවතක් ප්‍රමුඛතාවයෙන් පළ කිරීම,
දිවි තොර කරගත් ආකාරය සඳහන් කිරීම,
දිවි තොර කරගත් ස්ථානය සඳහන් කිරීම,
දිවි තොර කරගැනීමට හේතුව සරලව සඳහන් කිරීම,
හදිසි උපකාරක අංක සඳහන් නොකිරීම,

යන දිවි තොර කරගැනීම් වාර්තාකරණය පිළිබඳ මාර්ගෝපදේශනයන්ට පටහැණි කරුණු දක්නට ලැබිණි.

1) ඒ අනුව, මෙවැනි පුවත් වාර්තාවක් අනුකාරක දිවි තොර කරගැනීම් සඳහා ඉඩ පාදනු ඇතැයි ඔබ නොසිතන්නේ ද?

2) ඉහත මාධ්‍ය මාර්ගෝපදේශනයන් උල්ලංඝනය නොකරමින්, මෙම පුවත අවශ්‍ය බරපතල භාවයෙන් පළ කිරීමට හැකියාවක් නැතැයි ඔබ සිතන්නේ ද?

ඔබේ අදහස?

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

මූලාශ්‍ර:
[https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...](https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...)
[https://media.samaritans.org/.../Guidance_for_reporting...](https://media.samaritans.org/.../Guidance_for_reporting...)